# ගුරු භූමිකාව කෙරෙහි අධ්‍යාපන සමාජ විද්‍යාව විෂයයෙන් ලැබෙන දායකත්වය

## (ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ හතරක් ඇසුරින්)

නම : යූ.ජී.ඩබ්.ඩබ්. ගමගේ

විභාග අංකය : FGS/S/MSSc/2003/11

වර්ෂය : 2013 දෙසැම්බර්

කැලණිය විශ්වවිද්‍යාලයේ සමාජ විද්‍යාව පිළිබඳ සමාජීය විද්‍යාපති උපාධි පාඨමාලාවේ අවසන් වසර පරීක්ෂණයේ අවශ්‍යතාවක් සඳහා ඉදිරිපත් කෙරෙන ස්වාධීන පර්යේෂණ නිබන්ධනයකි.

ප්‍රවේශ අංකය: 1212
වර්ග අංකය:

සමාජ විද්‍යා අධ්‍යයනාංශය

කැලණිය විශ්වවිද්‍යාලය

කැලණිය

ශ්‍රී ලංකාව

**Contribution of the Educational Sociology to Teachers' Role (A Study based on four National Colleges of Education)**

**U.G.W.W. Gamage, Master of Social Sciences (Sociology),University of Kelaniya.**

The purpose of this study is to investigate the contribution of educational sociology on the teachers' role. To identify how the curriculum of Sociology of education, information was collected under the survey method through questionnaires, interviews and observations. Content analysis method was used to identify the contents and format of the curriculum. The sample consisted of one hundred teacher trainees attached to twelve NCoEs, nine lecturers, who teach the subject of educational sociology and four curriculum developers. The data collected through above methods were analyzed by descriptive statistical methods.

In the study it was revealed that there was no consistency among the NCoEs and the lecturers concerned regarding the subject. The professional development programmes have not been held since 1993 and the subject committees in NCoEs do not operate to the expected level. In addition, the subject specialists are not often consulted and internet is used in the minimal level.

The number of available reference books for the subject is limited and referring to books designed for other courses of study also is a barrier for the consistency. Although a competency based curriculum is implemented at NCoEs, the course of study is highly exam oriented. As a result, the subject educational sociology also emphasizes on knowledge rather than being practical. The research revealed that the traditional learning teaching methods are the popular mode of delivery. This procedure does not help in building a competent teacher and the impact of the subject on the learner is minimal.

The trainees have not paid attention to the relevance of the practical aspect of the subject in developing the teacher role and there are differences in perception of the content, knowledge, attitudes and skills between the trainees and the lecturers. From 1985, the subject educational sociology had developed as a full pledged subject in the system and by now the subject content is on par with the objectives of teacher education and objectives of NCoEs.

In the research, the following suggestions are made based on the data. The suggestions include, holding update programmes, providing opportunities for problem solving, introducing new teaching learning strategies for the subject to develop the teacher personality of the students, making the teaching of the subject more practical, strengthening `the subject committees at NCoEs, preparation of a resource kit for the subject, providing a comprehensive reference list for all units and making drastic changes in the teaching methodology.

**Keywords:** National Colleges of Education (NCoEs), Prospective Teacher, Educational Sociology, Teacher Role, Perception, Competency.

# සංක්ෂිප්තය

ගුරු භූමිකාව කෙරෙහි අධ්‍යාපන සමාජ විද්‍යාව විෂයයෙන් ලැබෙන දායකත්වය පිලිබඳ විමර්ශනය කිරීම මෙම අධ්‍යයනයේ අභිමතාර්ථය විය. සමාජ විද්‍යාව විෂයමාලාව ක්‍රියාත්මක වන ආකාරය හඳුනා ගැනීම සඳහා සමීක්ෂණ ක්‍රමය යටතේ ප්‍රශ්නාවලී, සම්මුඛ සාකච්ඡා, නිරීක්ෂණ සහ විෂය නිර්දේශයේ අන්තර්ගතය හා ආකෘතිය පිළිබඳ රටා හඳුනා ගැනීම සඳහා සන්ධාර විශ්ලේෂණ ක්‍රමය ද භාවිත කරන ලදී. ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ හතරක පාඨමාලා 12ක ශික්ෂණලාභීන් 100ක්, අධ්‍යාපන සමාජ විද්‍යාව විෂයය උගන්වනු ලබන කථිකාචාර්යවරුන් නවයක්, විෂය නිර්දේශ සකස් කිරීමේ නිරත විෂයමාලා සම්පාදකයින් හතර දෙනෙක් නියැදියට අයත් විය. පර්යේෂණ අරමුණුවලට අනුව රැස් කර ගත් දත්ත විස්තරාත්මක සංඛ්‍යාන ක්‍රම ඔස්සේ විශ්ලේෂණය කරන ලදී. 1993න් පසු මෙම විෂය සඳහා වෘත්තීය සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක නොකිරීම, වෘත්තීය සංවර්ධනයෙහි දී විෂය ප්‍රවීණයින් සමඟ සාකච්ඡා නොකිරීම, අන්තර්ජාලය භාවිත නොකිරීම, විද්‍යාපීඨ විෂය කමිටු ක්‍රියාත්මක වීම අවම මට්ටමක පැවතීම, අධ්‍යාපන සමාජ විද්‍යාව විෂයය ඉගැන්වීම පිළිබඳ විද්‍යාපීඨ තුළ මෙන් ම විද්‍යාපීඨ කථිකාචාර්යවරුන් අතර සංගත බවක් නොවීම ප්‍රධාන අනාවරණ විය. අධ්‍යාපන සමාජ විද්‍යාව සඳහා පරිශීලනය කළ හැකි ග්‍රන්ථ ඉතා සීමිත ය. විවිධ පාඨමාලා සඳහා සම්පාදිත ග්‍රන්ථ භාවිතය විෂය සංගතභාවයට බාධා ඇති කරයි. නිපුණතා පාදක ගුරු අධ්‍යාපනයක් අවධාරණය කළ ද ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමා පාඨමාලාව තවමත් විභාග කේන්ද්‍රීය වීම නිසා අධ්‍යාපන සමාජ විද්‍යාව විෂයය ද ප්‍රායෝගික බවින් ඈත් වී දැනුම අවධාරණය කරමින් ක්‍රියාත්මක වේ. සාම්ප්‍රදායික ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රම භාවිතය නිසා සාර්ථක ගුරු වෘත්තිකයකු ගොඩ නොනැගෙන බවත්, ගුරුවරයා තුළ සමාජ විද්‍යාව විෂයෙන් මතුවිය යුතු විවිධ සමාජ භූමිකාවන් සංවර්ධනයට එහි බලපෑම අවම බවත් අනාවරණය විය. ගුරු කුසලතා සංවර්ධනයට මෙම විෂය අන්තර්ගතය ප්‍රායෝගික ව අදාළ වන ආකාරය පිළිබඳ ව ශික්ෂණලාභීන් අවධානය යොමු කර නැත. එමෙන් ම විෂය අන්තර්ගතය දැනුම, ආකල්ප, කුසලතා පිළිබඳ ශික්ෂණලාභීන්ගේ හා කථිකාචාර්යවරුන්ගේ සංජානන අතර පරස්පරතා පවතී. 1985 සිට විට අධ්‍යාපන සමාජ විද්‍යාව වෙනම ම විෂයක් ලෙස සංවර්ධනය වී, මේ වන විට විෂය අන්තර්ගතය ගුරු අධ්‍යාපන අරමුණු, විද්‍යාපීඨ අරමුණු හා මනාව ගලපමින් සකස් වී ඇති බව අනාවරණය විය. සමාජ විද්‍යා විෂය දැනුම යාවත්කාලීන කිරීමේ වැඩසටහන් පැවැත්වීම, විෂය ගැටලු නිරාකරණයට අවස්ථා සම්පාදනය කිරීම, ශික්ෂණලාභීන්ගේ පූර්ණ පෞරුෂ සංවර්ධනය වන ආකාරයේ ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේද සැකසීම සඳහා අධ්‍යාපන සමාජ විද්‍යාව විෂයය සම්බන්ධ නැවත සලකා බැලීමක් කිරීම, ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේ දී සමාජ විද්‍යාත්මක සංකල්ප ගුරු භූමිකාවට අනුගත කර ගන්නා ආකාරය වඩා ප්‍රායෝගික ව භාවිත කිරීම සම්බන්ධව අවධානය යොමු කිරීම, විද්‍යාපීඨ විෂය කමිටු ශක්තිමත් කිරීම, විෂයයට අදාළ ව විස්තරාත්මක සම්පත් සංග්‍රහයක් සකස් කිරීම, විෂය නිර්දේශයේ අදාළ තැන්හි දී ආශ්‍රිත ග්‍රන්ථ සම්බන්ධයෙන් මඟ පෙන්වීමක් කිරීම, දැනට භාවිත කරන ඉගෙනුම්-ඉගැන්වීම ක්‍රමවල වෙනසක් ඇති කිරීම පර්යේෂණ යෝජනා වේ.

මුඛ්‍ය පදඃ ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ, ශික්ෂණලාභී ගුරුවරු, අධ්‍යාපන සමාජ විද්‍යාව, නිපුණතා, සංජානන, ගුරු භූමිකාව